# වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
## ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

**(1) . තනතුරු නාමය :- සහකාර අධ්‍යක්ෂ (නේවාසිකාගාර) (පුරප්පාඩු - 01)**

**(2) . සේවා ගණය :- කළමනාකාර (MM 1-2)**

**(3) . අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝටල් කලමනාකරණය හෝ සත්කාරක කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධිය.

**සහ**

II. ප්‍රථම උපාධි සුදුසුකම් අත්පත් කරගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම්**

i. පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II හෝ III)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සඳහා අනුමත කාර්යය මණ්ඩලය තුළ පවතින දරන්නාට පුද්ගලික වශයෙන් දක්වා ඇති සහකාර නේවාසික කළමනාකරු (MA 5-2) තනතුරෙහි අවම වශයෙන් වසර (05)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

**අතිරේක සුදුසුකම්**

i. පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් වේ.

**(4) . වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) . වැටුප් ක්‍රමය**

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

MM 1-2 - 2025 රු.94,170-10X2,480-15X3,450-170,720/=

**(6) . තනතුරට පැවරෙන කාර්යයන්**

- ආයතනයේ අභිමතාර්ථ සාධනයට අදාලව නේවාසිකාගාර හා භෝජනාගාර සේවා පරිපාලනය කිරීම.
- එම අංශවලින් ඵලදායී සේවයක් සැලසෙන පරිදි කළමනාකරණය කිරීම හා ආදායම් උත්පාදනය උපරිම කර ගැනීම.
- එම අංශවලට අදාල උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම,භාරකාරත්වය හා ඒවායේ නඩත්තුව.
- ආයතනයේ දේශන ශාලා හා සම්මන්ත්‍රණ ශාලා නඩත්තුව හා කළමනාකරණය කිරීම.
- නේවාසික සිසුන්ගේ අවශ්‍යතා හා සුභසාධන කටයුතු ඉටු කිරීම.
- ආයතන පරිශ්‍රය පවිත්‍රව හා අලංකාරවත්ව පවත්වාගෙන යාම හා අදාල අංශවල සේවක පරිපාලනයට අදාල කටයුතු ඉටු කිරීම.
- ආයතනයේ භෞතික සම්පත් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය.
- අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් හා නියෝග පරිදි අදාල අංශය ඵලදායී ලෙස මෙහෙයවීම.

**(7). බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමය**

| | | | |
|---|---|---|---|
| I | අදාල පළපුරුද්ද | - ලකුණු | 30 |
| II | අදාල අමතර අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු | 30 |
| III | අනෙකුත් කුසලතා/ කාර්යය සාධනයන් | - ලකුණු | 15 |
| IV | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | - ලකුණු | 25 |
| | | **ලකුණු** | **100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි (රා/ආ)
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල
2026.08.09